# ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය: මධ්‍යම පන්තික රැඩිකල්වාදයේ පැතිකඩක්

## The International Socialist Organization: A profile of middle class radicalism

**ජෙරී වයිට් විසිනි**
**2006 දෙසැම්බර් 22**

ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය (අයිඑස්ඕ) පසුගිය මාසයේ චිකාගෝ හි ඉලිනොයිස් සරසවියේදී "දක්ෂිනාංශයට එරෙහිව සටන් කරනු - සමාජවාදී විකල්පයක් ගොඩනගනු" යන මැයෙන් අධ්‍යාපනික සම්මේලනයක් පැවැත්වීය. එයට සහභාගි වූවන්ගෙන් බොහෝ දෙනා පාසල් ශිෂ්‍යයන් වූ අතර 200කට ආසන්න පිරිසක් සහභාගි වූ මෙම අවස්ථාව අයිඑස්ඕ පිලිබඳ දේශපාලනික පැතිකඩක් සම්පාදනය කලේය.

වෙන් වෙන් වැඩමුලු 25 ක් ද "එක්සත් ජනපද අධිරාජ්‍යයට මුහුන දීම" සහ "වෙනිසියුලාවේ ස්වයංනීර්නය සඳහා අරගලය" යන මැයෙන් වූ පුන්සැසියක් ද නොවැම්බර් 4 හා 5 දිනවල පැවති සම්මේලනයට ඇතුලත් විය. වැඩමුලුවලින් කිහිපයක් මාක්ස්වාදය, රුසියානු විප්ලවය හා සමාජවාදයට සම්බන්ධ තේමා පිලිබඳව වූ අතර අනෙක් ඒවා කාන්තාවන්ගේ, සමලිංගිකයන්ගේ හා කලු ජාතිකයන්ගේ "විමුක්තිය" පිලිබඳ අවධානය යොමු කරන ලදී. වැඩමුලුවල සාරසංග්‍රහවාදී මිශ්‍රනය, කට කතා සහ සාහිත්‍යය තුල සමාජවාදය හා කම්කරු පන්තිය පිලිබඳ නිරන්තරයෙන් සඳහන් කරන, එහෙත් සහතිකෙන්ම, ක්‍රියාවෙන් අනන්‍යතා දේශපාලනය සහ සමාජවාදයට ප්‍රතිවාදී අනෙකුත් වර්ගවල මධ්‍යම පන්තික රැඩිකල්වාදයන් දිරිමත් කරන්නා වූද තමන්ට ගැලපෙන ලෙස කම්කරු පන්තිය සතුරු දේශපාලන බලවේගයන් සමග පෙල ගස්සන්නා වූද අයිඑස්ඕවේ දිශාවනතිය පිලිබිඹු කලේය.

සති අන්ත සම්මේලනයේ දේශනමාලාව පුරා තම සංවිධානය දේශපාලනිකව ස්වාධීන කම්කරු පන්තික සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමේ යෙදී නොසිටින බව අයිඑස්ඕ නායකයෝ පැහැදිලි කලහ. ඒ වෙනුවට ඔවුහු දේශපාලන සංස්ථාපිතය මත පීඩනය හා බලපෑම් යෙදීමේ හැකියාව වැනි පුලුල් ප්‍රතිසංස්කරනවාදී විරෝධතා ව්‍යාපාරයක් ගොඩනැංවීමේ ඉදිරිදර්ශනයක් සංක්ෂේප කොට දැක්වූහ. ප්‍රසිද්ධ සිද්ධි කිහිපයකින් ම මෙම තේමාව ඉස්මතු විය.

"ඩිමොක්‍රටික්වරු: ලෝකයේ දෙවන වඩාත් ම උද්යෝගීමත් ධනේශ්වර පක්ෂය," නම් වූ එක් වැඩමුලුවක දී අයිඑස්ඕ නායක ජෝ ඇලන්, බුෂ් පරිපාලනයේ දක්ෂිනාංශක න්‍යාය පත්‍රයට හා යුද්ධයට විරුද්ධ ඇමරිකානු ඡන්දදායකයන්ගේ බලාපොරොත්තු ද යුද්ධය නො නවත්වා කරගෙන යාමට සහ මහ ව්‍යාපාරිකයේ අවශ්‍යතා රැකීමට කැප වී සිටින ඩිමොක්‍රටික නව කොංග්‍රස් බහුතරය ද අතර නො වැලැක්විය හැකි ගැටුමට අවධානය යොමු කලේය. ඩිමොක්‍රටික් පක්ෂයේ හානිකර බලපෑම බිඳ දැමීමටත් සංගත පාලිත පක්ෂ දෙකට එරෙහි අව්‍යාජ විකල්පයක් ගොඩනැගීමටත් මෙමගින් අවස්ථාව නිර්මානය කර ඇති බව ඔහු කීවේය. එහෙත් ඔහු යෝජනා කල විකල්පය වූයේ කම්කරු පන්තියේ සමාජවාදී ව්‍යාපාරයක් නොව හරිත පක්ෂයයි.

හරිතයෝ වනාහි කම්කරු පන්තික හෝ සමාජවාදී පක්ෂයක් නො වේ. ඔවුන් වනාහි පවත්නා ධනේශ්වර ලාභ ගරන පද්ධතිය පෙරලා දැමීමෙන් තොරව ආර්ථික හා දේශපාලන පද්ධතිය වඩා ප්‍රජාතන්ත්‍රවදී හා ශිෂ්ට ලෙස කල හැකිය යි කියා සිටින මධ්‍යම පන්තික ව්‍යාපාරයකි. සංගත හා දේශපාලන සංස්ථාපිතයට බලපෑම් දැමීමට උත්සාහ කිරීමේ ඔවුන්ගේ ප්‍රතිසංස්කරනවාදී ඉදිරි දර්ශනය කම්කරු පන්තියට ආවෘත අන්තරයක් බව සනාථ වී ඇත. උදාහරනයක් ලෙස, ජර්මනියේ දී සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් සමග සභාග ආන්ඩුවකට ඇතුල් වූ හරිතයෝ ජර්මානු අධිරාජ්‍යවාදය වෙනුවෙන් යුගෝස්ලාවියාවට හා ඇෆ්ගනිස්ථානයට එරෙහිව යුද්ධ දියත් කිරීමට සහයෝගය දෙමින් තම සාමවාදී කියාපෑම් අත්හැර මහා ව්‍යාපාරිකයේ අවශ්‍යතා ආරක්ෂා කලහ.

මෙම අයිඑස්ඕව හරිතයන් වෙනුවෙන් ක්‍රියාශීලීව උද්ඝෝෂනය කිරීමෙන් නතරවූයේ නැත. 2000 වසරේදී හරිත ජනාධිපති අපේක්ෂක රැල්ෆ් නාඩර්ට සහයෝගය දැක් වූ මෙම සංවිධානය, නාඩර් 2004 දී මෙක්සිකෝවෙන් පැමිනි, "නීති විරෝධී විදේශිකයන්ව", හෙලා දැකීමට දක්ෂිනාංශක දේශපාලනඥ පැට් බුචනන් සමග එකතු වුනු හා ඩිමොක්‍රටික් අපේක්ෂක ජෝන් කෙරීට අර්ධ නිල උපදේශකයෙකු ලෙස ඔහු ම ඉදිරිපත්වුනු තතු තුල පවා නැවත ඔහුට සහාය පල කලේය. පසු ගිය මැතිවරනයේ දී කැලිෆෝනියාවේ ආන්ඩුකාර අපේක්ෂක පීටර් කැමජෝ හා නිව් යෝර්ක්වලින් එක්සත් ජනපද සෙනෙට් සභාවට තරග කල හෝව් හෝකින්ස් වැනි

ඊනියා "වාම හරිතයන්ට" සහයෝගය දැක්වූ අයිඑස්ඕව තමාගේ ම සාමාජික ටොඩ් ෂ්රේරීන්ව කැලිෆෝනියාවේ සෙනට් සභික තනතුරකට හරිත අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් කලේය.

"ඔවුහු කුඩා ප්‍රජාතන්ත්‍රයක් සඳහා සටන් වදිති. හරිතයෝ යුද විරෝධී සෞඛ්‍යාරක්ෂන හා කම්කරු පන්තික හිතවාදී වෙති. ඔවුන්ට විවෘත දේශපාලන පද්ධතියක් අවශ්‍ය ය. ඓතිහාසික පෙරලිය නිශ්චිත සැලැස්මක් අනුගමනය නො කරයි. ඇමරිකාව තුල දක්ෂිනාංශික ආන්ඩුවක් ආධිපත්‍යය දරා ඇත. සමස්ත කම්කරුවන්ගෙන් සියයට 90 ක් ම වෘත්තීය සමිතිගත වී නැත. ලේබර් පක්ෂයක් පිලිබඳව ඉතා ම දුර පෙනෙන සලකුනක්වත් නැත. නව වාම ව්‍යාපාරයක් තරග සැලැස්මකට අනුව මතුවීමට යනවා නො වේ. ඒ වනාහි නාඩර් විය හැකිය. ඒ වනාහි නව වෘත්තීය සමිති විය හැකිය. නව කම්කරු ව්‍යාපාරයක ආරම්භය විය හැකි සංක්‍රමනික අයිතිවාසිකම් පිලිබඳ ව්‍යාපාරය වැනි සකල වර්ගවල වර්ධනයන් තිබිය හැක. සමාජවාදය නොයෙක් වර්නයන්ගෙන් පැමිනේ. මූලික කටයුත්ත වන්නේ ආරම්භයක් ගැනීමයි, යම් ගම්‍යතාවක් ලබා ගැනීමයි. එම ව්‍යාපාරයේ කොටසක් වන අපිට එමගින් වඩා අදාල සමාජවාදී ව්‍යාපාරයක් ඇති කර ගත හැකිය," යි හරිතයන්ව ආරක්ෂා කරමින් ඇලන් ප්‍රකාශ කලේය.

ඇලන් සරලව ම සකල දේශපාලනික අවස්ථාවාදීන්ගේ තර්කය පුනරුච්ඡාරනය කරයි. "පවතින යථා මහජන ව්‍යාපාරයේ" කොටසක් වීමටත් "එය වමට තල්ලු කිරීමටත්" අයිඑස්ඕ හරිතයන්ට හා අනෙකුත් ප්‍රතිසංස්කරනවාදී සංවිධානවලට සහයෝගය දැක්විය යුතුය. ඇලන්ට අනුව දේශපාලන නායකයන්ගේ සහ පක්ෂවල පන්ති ස්වභාවය හා වැඩපිලිවෙල විශ්ලේෂනය කරන අය එනම් අව්‍යාජ මාක්ස්වාදීන් හුදකලා බවට හා "අනදාලත්වයට" සුදුසුය. අයිඑස්ඕ හරිතයන්ට දෙන සහයෝගය යථාර්ථයේදී සේවය කරන්නේ කම්කරුවන්ගේ හා තරුනයන්ගේ දේශපාලන විග්‍රහයට වල කැපීමටත් ප්‍රතිසංස්කරනවාදය පිලිබඳ මිථ්‍යාවන් දල්වාලීමටත් ලාභ ගරන පද්ධතියට එරෙහිව අව්‍යාජ ව්‍යාපාරයක් වර්ධනය කිරීම මන්දනය කිරීමටත් පමනකි.

හරිතයන්ගේ ජාත්‍යන්තර භූමිකාව පිලිබඳ කිසිදු සාකච්ඡාවක් අදාල නොවේයයි කියමින් ඇලන් විසින් නොතකා හරිනු ලැබීය. "අනෙක් රටවල හරිතයන් කරමින් සිටින්නේ කුමක් ද යන්න මා දන්නේ නැත. අප කතා කරන්නේ ඇමෙරිකාවේ තත්වය ගැනයි අප උනන්දුවන්නේ ඇමරිකාව ගැනයි," ඔහු ප්‍රකාශ කලේය. අයිඑස්ඕව හරිතයන් සමග පවත්වන අවස්ථාවාදී සබඳතා, ඇමරිකානු සිවිල් යුද්ධය මධ්‍යයේ ලින්කන්ගේ යලි තේරී පත්වීමට පලමු වන ජාත්‍යන්තරය දුන් සහයෝගයට සමාන යයි අඟවමින් "මාක්ස්ට අබේ ලින්කන් හට සහයෝගය දියහැකිවුනි නම් මගේ අදහස වන්නේ හෝවී හෝකින්ස්ට සහය දීම නිවැරදි බවයි" යනුවෙන් ඇලන් නිගමනය කලේය.

ඇත්ත වශයෙන් ම කම්කරු ව්‍යාපාරය සහ වාම හඬතලන මධ්‍යම පාන්තික ප්‍රතිසංස්කරනවාදීන් අතර සම්බන්ධතාව පිලිබඳ මාක්ස්ගේ ආකල්පය අත්‍යන්තයෙන් ම පැහැදිලිය. මාක්ස් හා එංගල්ස් 1850 දී කොමියුනිස්ට් ලීගයේ මධ්‍ය අධිකාරියට ඉදිරිපත් කල ඒකාබද්ධ වාර්තාව තුල යුරෝපීය විප්ලවයන්ගේ අත්දැකීම් සම්පින්ඩනය කලේ මෙසේ කියමිනි. "ප්‍රජාතන්ත්‍රීය සුලු ධනේශ්වරය සෑම තැන ම පීඩනයට ලක් වන වත්මන් අවධියේ ඔවුන් නිර්ධනීන් ට එක්සත්කම සහ ප්‍රතිසන්ධානය පිලිබඳව පොදුවේ දේශනා කරමින් තම අත ඔවුන් වෙත දිගුකොට ඩිමොක්‍රටික් පක්ෂයේ අදහස්වල සියලු සෙවනැලි වැලඳගන්නා විශාල විරුද්ධ පක්ෂයක් ස්ථාපනය කිරීමට වලිකති. එනම් පොදු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පාඨ ආධිපත්‍යය දරන සහ තම සුවිශේෂී අවශ්‍යතා සලසවන්නා වූ ද ආදරනීය සාමයේ නාමයෙන් නිර්ධනීන්ගේ නිශ්චිත ඉල්ලීම් ඉදිරියට නො ගෙනා යුතු වූ ද පක්ෂ සංවිධානය උගුලට පැටලවීමට ඔවුහු වෙහෙසෙති. සම්පූර්නයෙන් ම ඔවුන්ට වාසි දායක බවට හැරෙන එවැනි සමගියක් නිර්ධනීන්ට සමස්තයක් ලෙස ම අවාසිදායක වේ. නිර්ධනීන්ට තමන්ගේ සමස්ත ස්වාධීනත්වය හා වෙහෙස මහන්සියෙන් ලඟා කර ගත් තත්වය අහිමි වී තවත් වටයකින් නිල ධනේශ්වර ප්‍රජාතන්ත්‍රයේ උපාංගයක් බවට පිරිහෙනු ඇත. එමනිසා මෙම සන්ධානය තීරනාත්මකව ප්‍රතික්ෂේප කල යුතුය."

අයිඑස්ඕ නිරතව සිටින්නේ හරියට ම මාක්ස් හා එංගල්ස් විසින් හෙලා දක්නා ලද මධ්‍යම පන්තික " අවස්ථාවාදී පක්ෂය" වර්ගයේ පක්ෂයක් ගොඩනැගීමේය. කම්කරු පන්තිය හා තරුන ජනයා අත්‍යවශ්‍යයෙන් තුන්වන ධනේශ්වර පක්ෂයක උගුලකට හසු කිරීමට හා ඩිමොක්‍රටිකයන්ගේ හා රිපබ්ලිකානුවන්ගේ යුදවාදී සහ මහා ව්‍යාපාරික හිතවාදී පක්ෂවලට එරෙහි අව්‍යාජ විකල්පයක් සොයා ගැනීමේ ඔවුන්ගේ අභිලාෂයන්වල හුස්ම හිරකිරීමට වැඩි යමක් මෙමගින් නො කරනු ඇත.

## සාංසිද්ධිකතාවයට යටත් වීම

කම්කරු පන්තියේ සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා, හරිතයන්ගේ, ඩිමොක්‍රටික පාක්ෂික ලිබරල්වාදයේ, වෘත්තීය සමිතිවාදයේ හෝ විරෝධතා දේශපාලනයේ කොයිඑකවුනත් ඕනෑ ම රූපාකාරයක සකල වර්ගවල ප්‍රතිසංස්කරනවාදී මිථ්‍යාවන්ට එරෙහි ඉවසිලිවන්ත දේශපාලන අරගලයක් අවශ්‍ය ය. අයිඑස්ඕ නායක පෝල් ඩිඇමටෝ විසින් ඉදිරිපත් කරන ලද ඔහු මෑතකදී ලියන ලද කෘතියක නාමය වන "මාක්ස්වාදයේ අර්ථය" යන නමින් ම යුත් වැඩමුලුවේ

දී අයිඑස්ඕ ඉදිරි දර්ශනය එම අරගලය නොවන බව යලිත් වරක් පැහැදිලි කලේය.

ධනේශ්වර ක්‍රමය පිලිබඳ මාක්ස්ගේ විශ්ලේෂනය සාකච්ඡා කරන සහ ප්‍රතිසංස්කරනවාදයට එරෙහිව සමාජවාදය, ජාතික පීඩනය හා අධිරාජ්‍යවාදී යුද්ධය වැනි ගැටලු පිලිබඳව ලෙනින්, ට්‍රොට්ස්කි හා රෝසා ලක්සම්බර්ග්ගේත් විවිධ උපුටා දැක්වීම් අඩංගු කර ගන්නා ඩිඇමටෝගේ කෘතිය තුල රූපිකව නිවැරදි දෑ කියනු ලබයි. කෙසේ වෙතත් ඔහු උපුටා දක්වන සංකල්පයන්ට ම පරස්පරව කෘතියේ සාරභූත තේමාව ගමන් කරන අතර අවසානයේ එය අයිඑස්ඕ දේශපාලන අවස්ථාවාදයට ක්ෂමාලාපයක් බවට පත්වේ. ඔහු වරින් වර තර්ක කරන්නේ කම්කරු පන්තියේ සාංසිද්ධික අරගලවල - වැඩ වර්ජන, විරෝධතා ආදියේ - පුපුරායාම මගින් සමාජවාදී විඥානයේ වර්ධනයට සම්බන්ධ කර්තව්‍යයන්ගේ අතිමහත් පදාසයක් ම කරනු ඇති බවයි. "එම අරගලවලට යා හැකි තරම් දුර තල්ලු කිරීමට උත්සාහ කිරීමේ" සහ "එම මාර්ගයෙන් කම්කරු පන්තියේ පුලුල් ස්තරවලට සමාජවාදී විකල්පයේ අවශ්‍යතාව හඳුන්වාදීමේ" අනුපූරක භූමිකාව රඟ දැක්වීමට මාක්ස්වාදීන්ව පිරිහෙලනු ලබයි. (පිටු 114).

ප්‍රධාන වශයෙන් සමාජවාදීන් ඉදිරිපත් කරනු ලබන්නේ කම්කරු පන්තිය යෙදී සිටින අරගලවලට මාවත පෙන්වන දේශපාලනික සංකල්පනාවන් සමග ගැඹුරු ගැටුමකට නොයා ඔවුන්ව "සංවිධානය කරන" වඩාත් ම සටන්කාමී වෘත්තීය සමිතිවාදීන් සහ සමාජ ක්‍රියාකාරිකයන් ලෙස ය. විශ්වාස කල නො හැකි ලෙස සාංසිද්ධිකව ජනිත සමාජවාදී විඥානය පිලිබඳ තම න්‍යායට උදාහරන ලෙස ඩිඇමටෝ පෙන්වා දෙන්නේ එකකදී ටෙහෙරානයේ පූජක තන්ත්‍රයක් සංස්ථාපනය වූ හා අනෙකේදී ස්ටැලින්වාදී නිලධරය විසින් ධනවාදය පුනස්ථාපනය කිරීම වසයෙන් හරියට ම සවිඥානික මාක්ස්වාදී නායකත්වයක් නොමැතිවීම නිසා අවස්ථා දෙකේදී ම කම්කරු පන්තිය ව්‍යසනකාරී ප්‍රතිවිපාක සහිත ඛේදජනක පරාජයන්ට මුහුන දුන් 1979 ඉරාන කම්කරුවන්ගේ සහ 1981 පෝලන්ත සොලිඩැරිටි ව්‍යාපාරයේ අත්දැකීම් ය.

"කම්කරු පන්තියේ විමුක්තිය කම්කරු පන්තියේ ම කර්තව්‍යයකි" යන මාක්ස්ගේ අවධාරනය වැඩමුලුව තුලදී ඩිඇමටෝ උපුටා දැක්වීය. කෙසේ වුවද මෙම මූලික මූලධර්මය වෙතින් ඔහු අතිමූලිකව සාවද්‍ය නිගමනයක් කරා එලඹුනි. කම්කරු පන්තියේ අරගල තුලින් සාංසිද්ධිකව සමාජවාදී විඥානය පැන නො නගින බවත් ඒ වෙනුවට එය සවිඥාන විප්ලවවාදීන්ගේ දේශපාලන පක්ෂයක් මගින් පන්ති අරගලය තුලට ගෙන ආ යුතු බවත් අවධාරනය කරන්නෝ මහජනයා කෙරෙහි අවඥා සහගත සහ "වංශාධිපතිවාදී" වෙති. ඩිඇමටෝ ඉහත දෙය වෙනුවට අවධාරනය කලේ සමාජවාදී විඥානය කම්කරු පන්තියේ අරගලවලින් ස්වයංක්‍රියව පැන නගින බවයි, කොන්දේසි ජනයාව කෝප ගන්වන අතර ජනයා පෙරලා සටන් කරති සංක්‍රමනික විරෝධතා, වෝල් මාට් විරෝධතා වැඩ වර්ජනය, සනීපාරක්ෂක කම්කරු වර්ජන එමගින් කම්කරු පන්තියේ ආත්ම විශ්වාසය සහ අභිමානය ඉහල දමති... අප වනාහි සියලු ගැටලුවලට විසඳුම සතුව සිටින විප්ලවවාදීන් බවත් අප ඒවා ඔබට පුද කරන බවත් ජනයාට කිව නො හැකිය. කම්කරු පන්තිය වෙතින් පැන නගින සමාජවාදය පන්ති අරගලයෙන් පිටස්තරව වර්ධනය නො වේ. ලෙනින් තමන් ම 1903 දී ලියූ ව්‍යාකූල සූත්‍රය ප්‍රතික්ෂේප කලේය, යි ඩිඇමටෝ සමාප්තියේ දී පැවසීය.

මෙය සත්‍යනම් මාක්ස් ධනවාදය පිලිබඳ පරිපූර්න න්‍යායික විශ්ලේෂනයක් කලේ ඇයි? සමාජවාදී විග්‍රහය සාංසිද්ධිකව පැනනගීනම් ලෙනින්, ට්‍රොට්ස්කි හා ලක්සම්බර්ග් තම කාලයෙන් අති මහත් වැඩි කොටස දේශපාලනය, ඉතිහාසය, ආර්ථිකය හා සංස්කෘතිය පිලිබඳව ලියමින් ගත කලේ ඇයි?

ලෙනින් කලා යයි කියනු ලබන "ව්‍යාකූල සූත්‍ර ගත කිරීම" පිලිබඳ ඩිඇමටෝගේ සැඳැහුම ලෙනින් ලියූ සම්භාව්‍ය කෘතිය *කලයුත්තේ කුමක් ද?* (මෙය ඇත්තම පලකලේ 1902 දීය) පිලිබඳ සඳහනකි. මෙම කෘතිය තුල ලෙනින් වර්ධනය කල සංකල්ප ප්‍රතික්ෂේප කලා නොව, ඊට වෙනස්ව ඒවා බොල්ශේවික් පක්ෂය ගොඩනැගීමත් 1917 ඔක්තෝබර් විප්ලවය හරහා රුසියානු කම්කරු පන්තිය විසින් සාර්ථක ලෙස බලය ගැනීමටත් පදනම බවට පත්විය. මෙම කෘතිය තුලදී ලෙනින් තර්කානුකූලව පෙන්වා දෙන්නේ කම්කරු පන්තියේ සාංසිද්ධික විඥානයට එහි ම මාවත් ඔස්සේ හාම්පුතුන්ට එරෙහිව අරගල කිරීමටත් පවත්නා සමාජ හා දේශපාලන පද්ධතිය තුල තම තත්වය ඉහල දමා ගැනීමට ආන්ඩුවට පීඩනය දැමීමටත් කම්කරුවන් එක්සත්වීම අවශ්‍යය යන ප්‍රාථමික සංකල්පනය වන වෘත්තීය සමිති විඥානයෙන් ඉහලට වර්ධනය විය නො හැකි බවයි. කම්කරු ස්ථාවරය "ධනේශවරය විසින් කම්කරු පන්තිය දෘෂ්ටිවාදාත්මකව වහල්භාවයේ තබා ගැනීම" යනුවෙන් ලෙනින් සඳහන් කල වෘත්තීය සමිතිවාදයෙන් බිඳී බලය ගැනීම තම කර්තව්‍යය කර ගත යුතුනම් එය සිදුවිය හැක්කේ කම්කරුවන්ගේ ප්‍රතිසංස්කරනවාදී මිථ්‍යාවන්ට එරෙහිව සමාජවාදී විඥානය වර්ධනය කිරීම සඳහා අරගලය කරන මාක්ස්වාදීන්ගේ ක්‍රමානුකූල ක්‍රියාකාරකමේ ප්‍රතිපලය වසයෙන් පමනකි. මෙම දෘෂ්ඨිවාදාත්මක අරගලය අංශුමාත්‍රයකින් හෝ ලඝුකොට දැක්වීම කරන්නේ කම්කරු පන්තිය මත ධනේශ්වර දේශපාලනයේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම පමනි යයි ලෙනින් පැවසීය.

එක්සත් ජනපදය තුල කම්කරු පන්තියේ සාංසිද්ධික විඥානය උත්කර්ෂයට නැංවීමට හිස නැමීමෙහි අර්ථය

වන්නේ ඩිමොක්‍රටික් පක්ෂයට අනුගත වීමයි. තම තරුන හා අත්දැකීම් රහිත සාමාජිකයන්ට "වංශාධිපතිවාදයට" හා "කම්කරු පන්තියට ආඥා පැනවීමට" එරෙහිව සංහතික ලෙස අනතුරු ඇඟවීම මගින් අයිඑස්ඕ නායකත්වය යථාර්ථයේදී ක්‍රියාකාරී වන්නේ කම්කරුවන් හා තරුන ජනයා අතර ඩිමොක්‍රටික් පක්ෂ හිතවාදී ප්‍රවනාතාවක් ලෙසයි.

සමාජවාදීන්ගේ කර්තව්‍යයන් පිලිබඳ ලෙනින්ගේ සංකල්පනාව කෙරෙහි ඇති පිලිකුල කොරියානු යුද්ධයේ කාලයේදී එක්සත් ජනපද අධිරාජ්‍යවාදය කොරියාවට හා චීනයට එරෙහි මිලිටරි ආක්‍රමනයට එරෙහිව එම රටවල් ආරක්ෂා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීම කරා මෙහෙය වූ "තම, රාජ්‍ය ධනවාදී" න්‍යායෙන් පසු 1950 දී හතරවන ජාත්‍යන්තරයෙන් නෙරපා දමන ලද හිටපු බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදී ටෝනි ක්ලිෆ් ද ඇතුලත් අයිඑස්ඕවේ දෘෂ්ටිවාදාත්මක හා දේශපාලනික මුතුන්මිත්තන් කරා ම ගෙනයනු ලැබිය හැක. *කල යුත්තේ කුමක් ද?* යි කැටිකොට දක්වන ලද සංකල්පනාවන් පිලිබඳව සඳහන් කරමින් ක්ලිෆ්, "සාංසිද්ධිකත්වය හා විඥානය අතර වෙනස මෙම සූත්‍රගත කිරීම මගින් අධිඅවධාරනය කල බවට සැකයක් නැත.... සාංසිද්ධිකත්වය සහ විඥානය යාන්ත්‍රිකව දෙපසින් තැබීමේ තර්කය වන්නේ දැනටමත් අරගලය තුල ඉස්මතුව ඇති කම්කරු පන්තික නායකත්වයේ යථා අංශයන්ගෙන් පක්ෂය සම්පූර්නයෙන් වෙන් කිරීමකි. සාංසිද්ධික අරගලය මගින් පෙරට දමන්නා වූ සියලු ගැටලුවලට විසඳුම් පක්ෂය සතුව ඇතැයි එම තර්කය උපකල්පනය කලේය. සටන්වැද සිටින බොහෝ දෙනාමත් අන්ධභාවයේ අභිමුඛ පැත්ත වන්නේ සුලු දෙනකුගේ සර්වඥතා ඥානයයි"යි ලිවීය.

## ධනේශ්වර ජාතිකවාදයට අනුගතවීම

කම්කරු පන්තියේ සෑම දූර්නායකත්වයට ම අවස්ථාවාදී ලෙස අනුගතවීම සඳහා වට්ටෝරුව වන්නේ අව්‍යාජ මාක්ස්වාදයට දක්වන මෙම සතුරුභාවයයි. "දැනට ම පැන නැගී ඇති කම්කරු පන්තික නායකත්වයට" යයි කියන දෙයට පමනක් නොව අධිරාජ්‍යවාදය විසින් සීමාවට පත් කරන ලද රටවල් තුල ධනේශ්වර ජාතිකවාදීන් වැනි කම්කරු පන්තික නොවන නායකත්වයන් ට ද එම අනුගත වීම කරයි. හියුගෝ චාවේස්ගේ ධනේශ්වර ජාතිකවාදී තන්ත්‍රය වෙනිසුයුලාවේ "සමාජවාදය" කරා ගෙන යමින් සිටින්නේ යයි කියා සිටි වෙනිසියුලානු ආන්ඩුවේ ඉහල පෙලේ නියෝජිතයෙක් ඇමතූ අයිඑස්ඕවේ පුන්සැසිවාරයේදී මෙය පැහැදිලි විය. චාවේස් ආන්ඩුවේ විකාගෝහි මහජන නියෝජිතයා සහ අයිඑස්ඕවට අනුබද්ධිත වෙනිසියුලානු සමාජවාදී විප්ලවීය පක්ෂයේ සාමාජික මාටින් සැන්චේස්, 1927 දී චීනයේ, 1965 දී ඉන්දුනීසියාවේ සහ 1973 චිලීහි කම්කරු පන්තියේ ලේවැකි පරාජයන්ට මග පාදමින් කම්කරු පන්තිය එවැනි ජාතිකවාදී ධනේශ්වර තන්ත්‍රයන්ට දේශපාලනිකව යටත් කිරීමට ස්ටැලින්වාදීන්ගේ හා ප්‍රතිසංස්කරනවාදීන් විසින් භාවිතා කරන ලද බේගල් පුනරුච්චාරනය කලේය.

කම්කරු පන්තිය දේශපාලනය බලය ගැනීමෙන් තොරව වෙනිසියුලාවේ සමාජවාදය ගොඩනගමින් පවතින බව මාටින් අවධාරනය කලේය. එවැනි බලය ගැනීමක් වෙනුවට එක් පසෙකින් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ද අනෙක් පසින් වෙනිසියුලානු ජනයාගේ ද පීඩනය හිටපු මිලිටරි පැරවුට් භටයන් තහවුරු කරන සමාජ ප්‍රතිසංස්කරන කමිටු ප්‍රචලිත කරමින්, තෙල්වල ධනය බෙදාහරිමින් "21 වන සියවසේ සමාජවාදය ගොඩනැගීම සඳහා" වමට තල්ලුවීමට බලකරමින් තිබෙන්නේ යයි ඔහු කීවේය.

1973 එක්සත් ජනපදය පිටුබලයක් ලේවැකි මිලිටරි කුමන්ත්‍රනයට පෙර චිලී ජනාධිපති සැල්වදෝර් ඇලන්ඩේගේ ස්ටැලින්වාදී හා රැඩිකල් ආධාරකරුවන් විසින් පතුරුවා හල මාරක මිත්‍යාවන් පුනරුච්චාරනය කරමින් සැන්චේස් කියා සිටියේ "වෙනිසියුලානු මිලිටරිය ඉහල කම්කරු පාන්තික සංයුතියකින් යුක්ත නිසා" චාවේස් ආන්ඩුව මිලිටරිමය පෙරලා දැමීමකට ලක් වීමේ අවදානමක් නොමැති බවයි. 2002 දී චාවේස්ගේ තන්ත්‍රයට එරෙහිව ඇමරිකානු පිටුබලය සහිතව සිදුවූ කුමන්ත්‍රන උත්සාහයට සම්බන්ධ වූවන් අත් අඩංගුවට ගන්නා ලෙස මහජනයා කරන බලපෑම් නොතකා චාවේස්, නිසැකව ම වොෂින්ටනය සමග නව උත්සාහයක් සැලසුම් කරන මෙම දක්ෂිනාංශක බලවේගයන් සමග "ප්‍රතිසන්ධාන කමිටු" ස්ථාපනය කරමනින් සිටින බව මාටින් පිලිගත්තේය.

,වෙනිසියුලාව සමාජවාදය කරා ගමන් කරන්නේ යයි ඔබ නො සිතුවත් සැබෑ අධිරාජ්‍යවාදී ව්‍යාපාරයක් වෙනුවෙන් කිසිදු කොන්දේසියක් ඉදිරිපත් කිරීමට ඔබ ක්‍රියා නො කල යුතුය. සුලු පරීක්ෂනයක් කර බැලීමට අපට උදව් දෙන්න. කම්කරුවන් ලෙනින්, ට්‍රොට්ස්කි හෝ මාක්ස් ගේ කිසිදු කෘතියක් කියවා නොමැති වූවත් ඔවුන්ට ඉෂ්ට කරගත හැක්කේ කුමක් දැයි දැකීමෙන් පුදුමයට පත්වනු ඇත" යයි චාවේස් තන්ත්‍රයේ මාක්ස්වාදීන් විරුද්ධවාදීන්ට පැහැදිලි ලෙස ම තරවටු කිරීමක් සමගින් සැන්චේස් සමාප්ත කලේය.

මෙම අදහස් අනුමත කරමින් අයිඑස්ඕවේ දීර්ඝ කාලීන නායකයෙකු හා එහි දෙසතියකට වරක් පලවන *ඉන්ටර්නැෂල් සෝෂලිස්ට් රිවිව්* සඟරාවේ සහකාර සංස්කාරක වන ජොඑල් ගේයර් "වෙනිසියුලාවේ ගැඹුරු රැඩිකලීකරන ක්‍රියාදාමයක් සිදුවන" බවත් " මහජන නායකත්වය සඳහා චාවේස් දෙස බලා සිටින" බවත් කීවේය. චාවේස්ගේ මිථ්‍යාවන් මගින් ඉදිරියට දමනු ලබන අන්තරායන් විස්තර කරනු වෙනුවට ගේයර් කියා සිටියේ සමාජවාදීන්ගේ කර්තව්‍යය වන්නේ "එම ක්‍රියාදාමයේ" චාවේස් ව්‍යාපාරයේ කොටසක් බවට

පත්ව හැකි තරම් එය වමට තල්ලු කිරීම, බවයි. "දේවල් අපගේ කාලසටහනට අනුව චලනය නොවේ. යාමට ඇති දුර ඉතා දිගු වන අතර චාවේස් වමට තල්ලු නොවේ නම් අනාගතයේදී අපට ඔහුගෙන් බිඳීමට සිදු විය හැක. එහෙත් ස්වයං නීර්නය සඳහා වන ස්වාධීන අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයක කොටසක් වීමට අපට අවශ්‍ය අතර චාවේස් පිලිබඳ ඕනෑ ම විවේචනයක් එම සන්දර්භය තුල සිදු විය යුතු ය" යි ගේයර් දිගටම කියාගෙන ගියේය.

අයිඑස්ඕ නායකයන් චාවේස්ව ව්‍යාජ ගැලවුම්කරුවකු ලෙස නිකම්ම ගොඩ නගනවා පමනක් නොව ඔවුහු එය අතිශය සවිඥානිකව කරති. ඉහත සඳහන් කල, "මාක්ස්වාදයේ සැබෑ අර්ථය" නම් කෘතිය තුල අයිඑස්ඕ නායක පෝල් ඩිඇමටෝ" ජාතිකවාදී ව්‍යාපාර "කොමියුනිස්ට් වර්නයන්ගෙන්" වර්න ගැන්වීමට දරන ඕනෑ ම ප්‍රයත්නයකට එරෙහිව ලෙනින්ගේ අනතුරු ඇඟවීම අවධානයට ලක් කරයි. චාවේස් සම්බන්ධයෙන් අයිඑස්ඕව හරියට ම කරමින් සිටින්නේ මෙයයි.

එක්සත් ජනපදයේ දේශපාලන තත්වය දෙසට හරීමේ දී යුද්ධයේ හා සමාජ ප්‍රතිගාමීත්වයේ ද්විපාර්ශ්වික සම්මුතියට එරෙහිව දේශපාලනිකව සවිඥාන කම්කරු පන්තික විරුද්ධත්වයක් වර්ධනය කිරීම පිලිබඳ කිසිදු හැකියාවක් නො වැදගත් යයි බැහැර කරන ගේයර්ගේ ආස්ථාන අවස්ථාවාදී බවෙන් අඩු නොවේ. ඒ වෙනුවට අයිඑස්ඕව බලාපොරොත්තු තැබිය හැකි හොඳම දෙය ලෙස ඔහු සඳහන් කලේ "යම් ආකාර යුද විරෝධී ක්‍රියාකාරිත්වයක්" ප්‍රතිජනනයයි. නැවතත්, එවැනි ව්‍යාපාරයක් ඩිමොක්‍රටික්වරුන්ට සහ හරිතයන් වැනි ප්‍රතිසංස්කරනවාදීන්ට එරෙහිව සමාජවාදී ප්‍රතිපත්තියක් මත පදනම් කිරීමට අයිඑස්ඕව සටන් නො කරනු ඇත. ඊට ප්‍රතිවිරුද්ධව, අපි හුදෙක් බහුතරයක් දරාගෙන ජනතාව එයවටා රැස්වන තෙක් අපේක්ෂාවෙන් සිටිනවා නො වේ... ඒ පිලිබඳව අපට යම් මිථ්‍යාවක් තිබුනි නම් ඒ වසර ගනනාවකට පෙරය. දැන් ඒවා හමාරය. මෙම රට තුල බැරෑරුම් කේඩරයක් සූදානම් කිරීමටත් බරෑරුම් රැඩිකල් නියෝජනයක් ගොඩනැගීමටත් අපට අවශ්‍යය" යයි ගේයර් කීවේය.

අයිඑස්ඕව සිත්හි දරාගෙන සිටින වර්ගයේ යුද විරෝධී ව්‍යාපාරයේ ඉදිරි දර්ශනය විය හැක්කේ කුමක් ද? මැතිවරනයට පසුව නිකුත් කල අයිඑස්ඕවේ *සෝෂලිස්ට වර්කර්* ප්‍රකාශනයේ එය විස්තර කරනු ලබයි. "රිපබ්ලිකන් යුගයේ අවසානය" නම් පරිකථනය, පුවත් පතේ කර්තෘ ඇලන් මාස්, "සාමය හෝ සාධාරනත්වය පිලිබඳව තකන ඕනෑ ම අයෙකුට රිපබ්ලිකානුවන්ගේ උග්‍රවීයාම බිහිරි තහවුරුවකි. වොෂින්ටනයේ ඒක පාක්ෂික පාලනයේ අවසානය වෙනසක් සඳහා භව්‍යතා විවරවීමක් නියෝජනය කරයි... දක්ෂිනාංශික න්‍යාය පත්‍රය ආපසු හැරවීම රඳා පවතිනු ඇත්තේ වොෂින්ටනයේ සියලු ම දේශපාලනඥයන් මත පීඩනය යෙදිය හැකි දේශපාලන හා සමාජ ව්‍යාපාරයක් යලි ගොඩනැංවීම මතයි" යයි ලියයි.

ඩිමොක්‍රටික් පාක්ෂික කොංග්‍රසයක්, අවම වැටුපක්, පහල සෞඛ්‍යාරක්ෂන සහ බෙහෙත් වට්ටෝරු මිල හා වර්ධිත ආර්ථිකයක් මුදා හරිනු ඇතැයි ඡන්දය දුන් අය බලාපොරොත්තු වන බව පෙන්වන මත විමසුමක් උපුටා දක්වමින් *සෝෂලිස්ට් වර්කර්* හි කතුවරයා මෙසේ ලියයි.

"ඩිමොක්‍රටික්වරුන් ඔවුන්ව ම අතහැර දැමුවහොත් මෙම අපේක්ෂාවන් ඉටුවීම අසලට නො පැමිනෙනු ඇත. පහලින් පීඩනයට මුහුන නොදුන හොත් ඩිමොක්‍රටික්වරු රිපබ්ලිකානුවන්ට සැබෑ විකල්පයක් ඉදිරිපත් නො කරති. එහෙත් 2006 මැතිවරනයේදී රිපබ්ලිකානුවන්ගේ ඒක-පක්ෂ පාලනය අභාවයට යාම මෙම පීඩනය ගොඩනැගීම සඳහා විභවයක් නිර්මානය කරයි."

රිපබ්ලිකානුවන්ගේ පරාජය "එක්සත් ජනපද ආන්ඩුවේ විදේශ සහ ස්වදේශ ප්‍රතිපත්ති වඩ වඩා ප්‍රශ්නයට ලක් කරන ජනයාව දිරිමත් කලහැකි ප්‍රධානධාරාවේ විවාදයක් තුල නව අවකාශයක් විවෘත කර" බවත් "මේ සියල්ලේ මූලිකාංගය වන්නේ රිපබ්ලිකානුවන්ගේ පරිපූර්න මැතිවරන පරාජය මගින් විවෘත කෙරෙන සෑම අවස්ථාවකම වාසිය යුද්ධයට එරෙහිවත් සාධාරනත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහන් අරගල යලි ගොඩනැගීමට යොදා ගැනීමයි" යනුවෙනුත් කියමින් කතුවැකිය සමාප්ත වෙයි.

මේ අනුව ඉරාක යුද්ධය සහ බුෂ් පාලනාධිකාරයේ දක්ෂිනාංශික න්‍යාය පත්‍රය, හට ඩිමොක්‍රටික බහුතරය මත පීඩනය යෙදීම මගින් ආපසු හැරවිය හැකිය යන ව්‍යාජයට අනුබල දීමට නේෂන් සඟරාව හා අනෙකුත් වාම ලිබරලුන් සමග අයිඑස්ඕ එක්වේ.

ඩිමොක්‍රටික් පක්ෂයට එරෙහිව දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට කරන අරගලය ප්‍රතික්ෂේප කරන මෙම මධ්‍යම පන්තික විරෝධයේ අද්වතාත්වරු ඒ වෙනුවට ඩිමොක්‍රටික් බහුතරයක් යලි පැමිනීම මගින් වොෂින්ටනයේ රිපබ්ලිකානු ආධිපත්‍යය මගින් තමන්ව වසර ගනනාවක් පුරා කොන් කරනු ලැබ තිබීම අවසන්ව නැවතත් දේශපාලන බලයේ යහන් ගැබට ඇතුල්වීමට අවසර ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙති. දශක ගනනාවක් පුරා උපයාගත් අවස්ථාවාදී උපාමාරු ද කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය උදෙසා අව්‍යාජ මාක්ස්වාදීන්ගේ අරගලය කෙරෙහි සතුරුභාවය ද සමගින් අයිඑස්ඕව උදාසීනත්වය බිඳදමා ධනේශ්වර දේශපාලනයේ " ප්‍රධානධාරා විවාදයට" ඇතුල්වීමට ස්ථානගත වෙමින් සිටී.

© www.wsws.org